**ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය වර්ෂය තුළ ගෘහ භාණ්ඩ මිලට ගැනීමට රු.809,421 ක් හා යන්ත්‍ර උපකරණ මිලට ගැනීමට රු.167,999 ක් වැයකර තිබුණ ද, භාණ්ඩාගාර සටහනේ SA 82, එම අගය ආරම්භක ශේෂයට ගැලපීමක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර සටහන තුළ එසේ ඇතුළත් වීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කර ඇත. ඒ අනුව අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට සටහන් කර ගෙන ඇත. | නිවැරදි අගයන් දැක්විය යුතුය. |

#### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.269,096 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට 2023 පෙබරවාරි 28 දක්වා ක්‍රියාකර නොතිබුණි. එහි වර්ෂ 05 ට වැඩි රු.22,588 ක ණය ශේෂයක්ද පැවතුණි. | වර්ෂ 5 ට වැඩි ණය ශේෂය වූ රු.22,588/- කපා හැරීමට අනුමැතිය හිමි වී ඇත. සේවය අතහැර ගොස් සිටින ඉතිරි නිළධාරීන් දෙදෙනාගෙන් අයවිය යුතු රු. 246,508/- ණය මුදල පියවීමට කටයුතු කරන ලෙස දැනුම්දී ඇත. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 ට අනුව ඇප ලේඛනය මේ වනවිට සකස් කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 447(5) ප්‍රකාරව බැරකම් ලේඛනය | බැරකම් ලේඛනය ආරම්භ කර පවත්වාගෙන යාමට අදාළ නිළධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද මගින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ අදායම රු.262,000.000 ක් වුවද අමාත්‍යාංශය විසින් 2022 වර්ෂය සඳහා ලද ශුද්ධ ආදායම රු.215,020,000 ක් වූයෙන් සියයට 18ක් අඩුවෙන් ආදායම රැස්කර තිබුණි. | ඩොලරයේ අගය ඉහල යාම හා රටෙහි පැවති අයහපත් ආර්ථික තත්ත්වය සමඟ ආනයනික වැඩසටහන් සීමා වූ අතර බොහොමයක් රූපවාහිනි නාලිකා ආනයනික වැඩසටහන් විකාශනය කිරිම සීමා කිරීම මත ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් වලින් උපයන ලද ආදායම සීමා විය. | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කර අපේක්ෂිත ආදායම් රැස්කිරීමට ප්‍රයත්න ගත යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ පුනරාවර්තන වැය විෂයයන් 04කින් පුනරාවර්තන වැය විෂයයන් 08 ක් වෙත සලසා තිබුණු රු.12,961,918 ක් මු.රෙ 66 මඟින් මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන කෙටුම්පත් ඇස්තමේන්තු භාණ්ඩාගාරය විසින් අනුමත කිරීමේදී සිදුවන සංශෝධනයන් හේතුවෙන් මෙම තත්ත්වය ඇති වන අතර ඊට අමතරව පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන සළසා ගැනීමට සිදුවිය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට උපරිම ප්‍රයත්න ගත යුතුය. |
| (ආ) | වැය විෂයයන් 03 ක් සඳහා සලසාගෙන තිබූ රු.525,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 100 ක් හා තවත් වැය විෂයයන් 21ක් සඳහා සලසාගෙන තිබූ රු.181,525,000 ක් ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.149,009,721 ක් උපයෝජනය නොකර පැවති අතර එය සියයට 33 සිට සියයට 98 දක්වා ප්‍රතිශතයක් විය. | වියදම් පාලනය සඳහා වූ අයවැය චක්‍රලේඛවලට අනුකූලව නව මිලදී ගැනීම් සීමා කිරීම, JICA ව්‍යාපෘති සඳහා මූල්‍යනය තාවකාලිකව අත්හිටුවීම හේතු කොට ගෙන DTTB ව්‍යාපෘතිය අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටමට ළඟා නොවීම ආදී හේතු මත ප්‍රතිපාදන උපයෝජනය සීමාවිය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට උපරිම ප්‍රයත්න ගත යුතුය. |
| (ඇ) | වැය විෂයයන් 04 ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසුද වැය විෂයයන් 03 ක සියයට 21 සිට සියයට 84 දක්වා පරාසයක් තුළ ඉතිරිවී තිබූ බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශ පරිශ්‍රය තුළ සූර්ය පැනල සවිකිරීම හේතුවෙන් විදුලි වියදම් සැළකිය යුතු මුදලකින් පහළ යාම, වියදම් පාලනය සඳහා වූ අයවැය චක්‍රලේඛ වලට අනුකූල වෙමින් රාජ්‍ය මාධ්‍ය සම්මාන උළෙල නොපැවැත්වීම ආදී කරුණු මත අදාළ වැය විෂයන්වල ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්වලට මාරු කිරීමෙන් පසුවද ඉතිරි විය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට උපරිම ප්‍රයත්න ගත යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ බැරකම්වල දක්වා තිබූ 105-1-3-1402 වැය විෂයයෙන් ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා රු.252,582 ක් බැරකම් වලට එළඹ තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. අත්‍යවශ්‍ය හා නොවැළැක්විය හැකි කරුණු යෙදීම මත මෙම තත්ත්වය ඇති වී තිබේ. ඉදිරියේදී වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹීමෙන් වළකින ලෙස අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දෙන ලදී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශයේ 3.3 ප්‍රකාර, මූල්‍ය ප්‍රකාශන වල ඇමුණුම අංක III යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශන (SA 92) සමග සැසඳී තිබිය යුතු වුවත් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.2,480,310ක් වූ අතර, භාණ්ඩාගාර වාර්තා අනුව එම ශේෂය රු.1,233,641ක් වූයෙන් රු.1,246,669 කින් සැසඳී නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. බැදීම් හා බැරකම් ප්‍රකාශය සකස් කිරිමේදී පැවැති දූර්වලතා හේතුවෙන් භාණ්ඩාගාර වාර්තා සැසඳීමේදී ප්‍රමාදයක් සිදුව ඇත. ඉදිරියේදී භාණ්ඩාගාර සටහන් පරීක්ෂා කර සැසඳීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i)මු.රෙ.104 | - | අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් 2022 වර්ෂය තුළදී අනතුරකට ලක්වී තිබූ අතර මෙම අනතුරු සම්බන්ධයෙන් මුදල් | 2022 වර්ෂයේ අවසාන කාලයේ සිදුවූ අනතුරු වල මු.රෙ. 104 අවසන් පරීක්ෂණයන් මේ වනවිට සිදුවෙමින් පවතී. එම පරීක්ෂණ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අවසන්වූ වහාම අදාල තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| | (ii)මු.රෙ.880 | - | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව අමාත්‍යාංශයේ නිලධාරීන් 15 දෙනෙකු පමණ ඇප තබා නොතිබුණි. | අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ ලේඛනය සකසමින් පවතී | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය හා 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020 (11) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | සියලුම රජයේ ආයතන, තම ආයතනය විසින් සේවාවන් සඳහා අයකරන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කළයුතු වුවද අමාත්‍යාංශය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2017.11.07 දිනැති අංක 2044/21 දරණ මුදල් අමාත්‍යාංශ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අවසන් වරට සංශෝධනයක් සිදු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 වගන්තිය | - | අමාත්‍යාංශය සතු වාහන 32 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | වර්තමානයේ පවතින ඉන්ධන සීමා හේතුවෙන් ඉන්ධන දහනය කිරීම පරීක්ෂාව අපහසු වී ඇත. 2022.10.12 දිනැතිව තෝරාගත් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කරන ලදි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | **2020 අගෝස්තු 28 දිනැති 01/2020** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | | | |
| | (i) I කොටසේ 9 මගින් සංශෝධිත මු.රෙ. 371(5) ඡේදය | 684,195 | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් එකතුව රු. 684,195 ක අතුරු අග්‍රිම දින 04 සිට මාස 7.5ක පරාසයක් දක්වා ප්‍රමාදයකින් පියවීම් සිදුකර තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිමයන් ලබා ගෙන අදාල කාර්යයන් ඉටු කිරීමේදී අදාල සේවාව හෝ කාර්ය නිමකර දින 10 ක් ඇතුළත අත්තිකාරම් පියවන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| | (ii)I කොටසේ 11.1 මගින් සංශෝධනය කරන ලද මු.රෙ. 756(6) | - | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර එහි වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් 2023 අප්‍රේල් 12 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. එය නිම කළ වහාම වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | PED/RED/01/01/2020/02 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව සියලුම රජයේ ආයතන තම ආයතන වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර, ඊළඟ වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රතිපාදන හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගැටලු පැවතීම හේතුවෙන් අදාළ ක්‍රියාකාරී සැලසුම් අනුමත කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම නිසි කාලසීමාව තුළ ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක PED/RED/01/01/2020/02 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 අනුව ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වියයුතු ක්‍රියාත්මක කාල රාමුව හා අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (output/ outcome), | ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව, අපේක්ෂිත නිමැවුම්, නිමැවුම් ප්‍රතිඵල කාර්තුමය වශයෙන් ඉදිරිපත් කර ඇත. මෙම අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාරය අනුව කාල රාමුව කාර්තුමය වශයෙන් ඉදිරිපත් කිරීම පහසු වේ. ඉදිරියේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඉදිරිපත් කර ඇති පරිදි මාසික | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම හා ප්‍රතිඵල සකස් කරනු ලැබේ. | |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 38 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | නීති සම්පාදන කටයුතුවලදී නීතිපති හා නීති සම්පාදක දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ ලැබීම ප්‍රමාද වීම, අමාත්‍ය මණ්ඩල අනු කමිටු සඳහා පනත් කෙටුම්පත යොමු කිරීම හේතුවෙන් අනු කමිටු වාර්තා ලැබෙන තෙක් ඉදිරි ක්‍රියාකාරකම් නැවැත්වීමට සිදු වීම. ජාතික සංවර්ධනය සඳහා වූ මාධ්‍ය මධ්‍යස්ථානය ප්‍රතිපාදන නොලැබීම සහ රටේ පැවති දේශපාලනික වාතාවරණය හමුවේ බහුතරයක් ක්‍රියාකාරකම් සිදු නොකරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුව උපරිමයෙන් කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ රාජ්‍ය ප්‍රතිපත්තිය හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීම වුවද, එවැනි කාර්යයක් සිදුකළ බවට විගණනය වෙත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ අනුව කටයුතු කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරකම් 10 ක භෞතික ප්‍රගතිය සියයට 50කට අඩු ප්‍රතිශතයක් වී තිබුණි. | විවිධ හේතු ඉදිරිපත් කර තිබුණි. | අපේක්ෂිත ප්‍රගතිය ලගා කර ගැනීමට උපරිමයෙන් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා ආනයනය කරන ලද ටෙලිනාට්‍ය, චිත්‍රපටි හා වානිජ වැඩසටහන් සඳහා නිෂ්කාශන සහතික 1382 ක් නිකුත් කර තිබූ අතර, ඒ සඳහා රු.215,020,000 ක් බදු ලෙස අයකර තිබුණු අතර 2021 වර්ෂයේ තිබූ එම ආදායම රු.438,470,000 ක් විය. ඒ අනුව සියයට 51 කින් ආදායම අඩු වී තිබුණි. | ඩොලරයේ අගය ඉහල යාම හා රටෙහි පැවති අයහපත් ආර්ථික තත්ත්වය සමඟ ආනයනික වැඩසටහන් ආනයනය කිරීම සීමා වූ අතර බොහොමයක් රූපවාහිනි නාලිකා ආනයනික වැඩසටහන් විකාශනය කිරීම සීමා කිරීම මත ආනයනික ටෙලි නාට්‍ය,චිත්‍රපට හා වාණිජ වැඩසටහන් වලින් උපයන ලද ආදායම සීමා විය. | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය 2014 ආරම්භ කළද ක්‍රියාත්මක නොවීම නිසා නැවත 2021 වර්ෂයේ කැබිනට් මණ්ඩල තීරණයක් පරිදි යාවත්කාලීන කරන ලද අතර, තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ තුළින් රට පුරා විසිරී පවතින විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීමට නියමිත වුවත්, 2023 ජූනි 30 වන විටත් එක් විකාශනාගාරයක් හෝ ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. 2022 වර්ෂය සඳහා රු.මිලියන 119.50 ක් ලැබී තිබුණ ද, උපයෝජනය කර තිබුණේ රු.මිලියන 8.67 කි. ඒ අනුව රු.මි 110.83ක් ඌන උපයෝජිතව පැවතුණි. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | ව්‍යාපෘති වල කටයුතු අදාළ පරිදි සිදුකළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර ඊළඟ වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළයුතුය. නමුත් අමාත්‍යාංශය සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2022 වර්ෂය සඳහා පමණක් වූ අතර, ප්‍රසම්පාදන සැලැස්ම 4.2.2(ඉ) ප්‍රකාරව මාස 06 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | එකඟවෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) අමාත්‍යාංශය විසින් 2021, 2022 වර්ෂ වල සිදුකල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) ගෘහභාණ්ඩ මිලදී ගැනීම හා අභ්‍යන්තර අලංකරණ කොන්ත්‍රාත්තු කටයුතු 2021 ඔක්තෝබර් 28 දින පෞද්ගලික සමාගමකට රු.39,262,200 ක හා අවිනිශ්චිත වියදම් සියයට 10 ඇතුළු මිලකට (බදු රහිත) ප්‍රදානය කර තිබුණද 2022 අගෝස්තු 29 දින වන විට රු.40,475,229 ක් ගෙවා තිබුණි.<br>ඒ අනුව එදින වන විටත් ඇස්තමේන්තුව ඉක්මවා රු.1,213,029 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | ගිවිසුම අනුව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| (ii) ශ්‍රවණාගාර නවීකරණය සඳහා රු.5,923,727 ක ඇස්තමේන්තුව නොසලකා රු.8,093,410 ක් වූ ඇස්තමේන්තුවක් පිළිගැනීම තුළින් අමාත්‍යාංශයට රු.2,169,683 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iii) අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය සඳහා කාර්යාලයීය ඉඩකඩ ලබා ගැනීමට අතිරේක ස්ථානයක් ඉදිකිරීම සඳහා නවීකරණ කොන්ත්‍රාත්තුව සිදුකරන කොන්ත්‍රාත් ආයතනයෙන් මිල ගණන් ලබාගෙන උපදේශක ආයතනය වෙත යොමු කර නිර්දේශ ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ආයතනය විසින් බදු රහිතව රු.6,745,492 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර උපදේශක ආයතනය විසින් රු.5,621,511 ක මුදලක් නිර්දේශ කර තිබුණි. ඒ සඳහා රු.5,621,511 ක වටිනාකමට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ලංසු කැඳවීමකින් තොරව ප්‍රසම්පාදන කමිටු තීරණය මත සිදුකර තිබුණි. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iv) (a) අමාත්‍යාංශ පරිශ්‍රය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ප්‍රසම්පාදනයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 අනුව ලංසු සුරක්ෂණ/ ලංසු සුරක්ෂණ ප්‍රකාශ සම්මත පරිදි ඉදිරිපත් | පසුව පිළිතුරු සපයනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොකිරීම නිසා අවම ලංසුව උපදේශක ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර, දෙවන ලංසුව උපදේශක ආයතනය විසින් නිර්දේශ කර තිබුණි. නමුත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් උපදේශක ආයතනය විසින් ප්‍රතික්ෂේප කළ කොන්ත්‍රාත්කරු නිර්දේශ කරමින් අවිධිමත් තීරණයකට එළඹ ප්‍රසම්පාදනය පිරිනැමීම නිසා රජයට රු.5,492,939 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | | |
| (b) මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී නිසි පරිදි අවශ්‍යතා හඳුනා නොගැනීම නිසා අභ්‍යන්තර ජාල පද්ධතිය හා දූරකථන සම්බන්ධතා වෙනුවෙන් රු.4,489,873 ක් අමතර වැය බරක් දැරීමට සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | ඇස්තමේන්තු සකස් කිරීම නිසි පරිදි සිදුකළ යුතුය. |
| (v) ගෘහභාණ්ඩ මිලදී ගැනීම හා අභ්‍යන්තර අලංකාර කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා ලබාගැනීමට කොන්ත්‍රාත් මුදලෙන් සියයට 08ක ගාස්තුවකට යටත්ව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය පත්කර තිබුණි. එහෙත් ඔවුන්ගේ එම අධීක්ෂණය නිසියාකාරව සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | උපදේශන ගිවිසුමේ පරිදි කටයුතු කළ යුතුය. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් "විසුම්පාය" ගොඩනැගිල්ලේ කොටසක ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා කාමර වෙන්කිරීමේ හා අනෙකුත් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් මාසයේදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් රු.1,373,862 ක් ලබාගෙන තිබුණ ද, 2022 ජුනි මාසයේදී කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කර අමාත්‍යාංශ පරිශ්‍රය තුළ පිහිටුවීම නිසා මාස 06ක් වැනි කෙටි කාලපරිච්ඡේදයකට දරන ලද ඉහත වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | හමුදා මූලස්ථානයෙන් ගෙවිය යුතු මුදල් නොගෙවීම හේතුවෙන් විදුලිය විසන්ධි කිරීමට ලක්වී ඇති අතර, විදුලි බිල්පත් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසු ඉදිරියේදී විදුලි බිල්පත් නිරවුල් කරන බව හමුදා මූලස්ථානයෙන් දන්වා ඇත. මෙලෙස විදුලිය නොමැතිව කාර්යාලය පවත්වා ගෙන යාමට නොහැකිවීම තුළ ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ නිලධාරීන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත රැගෙන ඒමට කටයුතු කර ඇත. | පිරිවැය සඳහා ප්‍රතිලාභයක් ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | විදුලිබල අමාත්‍යාංශයට අයත් අංක CAR 1977 දරන මෝටර් රථය ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබාදී තිබුණු අතර 2022 මැයි 20 දින ඇතිවූ කාර්මික දෝෂයක් හේතුවෙන් එදිනම අදාළ නියෝජිත ආයතනය වෙත භාරදී තිබුණි. රු.111,290 පරීක්ෂණ, අනිකුත් වියදම් හා ගාස්තු ලෙස නියෝජිත ආයතනය වෙත ගෙවා තිබුණු අතර මුලින් රු.101,691 කට ලබාදී තිබුණු ඇස්තමේන්තුව පසුව රු.1,232,362 ක් ලෙස සංශෝධනය කර තිබුණි. පසුව මෙම වාහනයේ අළුත්වැඩියාව රු.427,500 කට එකඟවී පෞද්ගලික ආයතනයක් වෙත භාරදී තිබුණද මෙතෙක් අමාත්‍යාංශය වෙත වාහනය භාරගැනීමට හා විදුලිබල | අලුත්වැඩියා ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවට අනුව රථය අළුත්වැඩියා කිරීමට යොමුකළ අතර, එහි වටිනාකම රු. 427,500ක් වේ. රථය අළුත්වැඩියාව අවසන්වී ගෙවීම ඉංජිනේරු මහතා විසින් නිරීක්ෂණය කරන ලද අතර, රථයේ වෙනත් දෝෂ තත්ත්වයක් නිරීක්ෂණය වී ඇති බැවින් එය පරීක්ෂා කරන තුරු භාරදීම සඳහා සැකසූ රු. 427,500ක් වටිනා චෙක්පත එම ආයතනයට ලබාදී නොමැත. | අමාත්‍යාංශ අතර වත්කම් තාවකාලිකව හුවමාරු කර ගැනීම, අළුත්වැඩියා වියදම් දැරීම, වත්කම් නිරවුල් කිරීම මනා පාලනයකින් යුතුව සිදුකළ යුතුය. |

අමාත්‍යාංශය වෙත වගකීම නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා වාහනයේ පැවැත්ම අවදානමට ලක්වී තිබුණි.

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඊට ප්‍රමාණවත් මුදලක් අත්තිකාරම් ලෙස ලබාදීම කළයුතු වුවත් නිලධාරීන් 05දෙනෙකුට අවස්ථා 08කදී ලබාදුන් අත්තිකාරම් උපයෝජනය කිරීමෙන් තොරව දින කිහිපයක් අත රඳවාගෙන සම්පූර්ණයෙන්ම පියවා තිබුණු බව නිරීක්ෂණය විය. | වෙළඳපොළ තුළ සුදුසු භාණ්ඩ නොතිබීම, ගමන් අවලංගු වීම, සාකච්ඡා අවලංගු වීම ආදී හේතු මත අත්තිකාරම් ලෙස ලබා ගත් මුදල් උපයෝජනයෙන් තොරව රඳවා නැවත සම්පූර්ණයෙන් පියවීමට සිදුවිය. | අවශ්‍යතාවයට අනුව අත්තිකාරම් ලබාදීමට සහ වෙනස්වන වාතාවරණය අනුව වහාම පියවාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එක් අග්‍රිමයක් ලබාදී එය පියවීමට ප්‍රථම නැවත අග්‍රිම ලබාදුන් අවස්ථා 09 ක් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය තුළ සිටිනුයේ සීමිත මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාවක් බැවින් නැවත අතුරු අග්‍රිම ලබාදීමට සිදුවිය. කෙසේවෙතත් මේ වන විට එවැනි අවස්ථා වළක්වා ගැනීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දි ඇත. | අග්‍රිම ලබාදීම නිසි පාලනයකින් යුතුව සිදු කළ යුතුය. |
| (ඇ) | භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් සුරක්ෂිත කරමින් ප්‍රශස්ත මාධ්‍යකරණයක් තහවුරු කිරීමේ අරමුණ සහිතව විද්‍යුත් මාධ්‍ය සඳහා විකාශන අධිකාරි පනත විගණිත දින දක්වාම සකස් කර නොතිබුණි. එමෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය කිරීමේ ක්‍රමවේදයද නිමකර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් විකාශන පනතක් කෙටුම්පත් කිරීමේ කටයුතු සිදු කරමින් පවති.. රූපවාහිනී හා ගුවන්විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය කිරීමේ ක්‍රමවේදය මෙම යෝජිත පනතට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී. | පනත සකස් කිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2022 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර 34 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට හා වාර්ෂිකව හෝ කාලීනව බලපත්‍ර අලුත් කිරීමේ විධිමත් ක්‍රමවේදය සකස් නොකිරීම නිසා බලපත්‍ර ගාස්තු ලෙස හා බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ලෙස ලබාගත හැකි විශාල ආදායමක් රජයට අහිමිවී තිබුණි. තවද ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇති කිරීමට පොදු ආකෘතියක් විගණිත දින දක්වාම හඳුන්වා දී නොතිබුණි. | ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ගාස්තු අයකර ගැනීම සඳහා මේ වන විටත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඔස්සේ අනුමැතිය ලබාගෙන ඇත. තවද පොදු ආකෘති පත්‍රය කෙටුම්පත් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා පිළිතුරක් ලැබී නොමැත. | බලපත්‍ර ගාස්තු ලෙස හා බලපත්‍ර අළුත්කිරීමේ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඉ) | factchecker.lk ඩොමේන් නාමය යටතේ පවත්වාගෙන යන වෙබ් අඩවිය සිංහල බසින් 2022 ජනවාරි 19 දිනද, දෙමළ හා ඉංග්‍රීසි බසින් 2021 නොවැම්බර් 10 දිනෙන්ද පසු යාවත්කාලීන කර නොතිබුණි. | පසුව පිළිතුරු සපයනු ලැබේ. | වෙබ් අඩවි යාවත්කාලීන කල යුතුය. |
| (ඊ) | ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය සඳහා 2021 පෙබරවාරි 02 දින සිට කාර්ය මණ්ඩලය වරින්වර බඳවා ගැනීම හා සේවය දීර්ඝ කිරීම් සිදුකර තිබුණ ද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගැනීමට කටයුතු කරමින් පවතී. | කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසාර සංවර්ධනය අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන ඒවා අවම කිරීමට ගතයුතු පියවරයන් වශයෙන් නිසි ක්‍රම සම්පාදන | වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීමට අදාල පනත මේ වනවිට කෙටුම්පත් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2022.08.18 දිනැතිව යොමු | විවිධ බාධාකාරී තත්ත්වයන් යටතේ වුවද තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට උපරිම අවධානය යොමු කළ |

| | | |
|---|---|---|
| සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පිලියම් හා තීරණ ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. තවද තිරසර සංවර්ධන ඉලක්ක 02 ක් හඳුනාගෙන තිබූ අතර, ඉන් පළමු ඉලක්කයේ පළමු දර්ශකය සියයට 20ක්ද, දෙවන ඉලක්කයේ පළමු දර්ශකය සියයට 30ක්ද, දෙවන දර්ශකය සියයට 06ක්ද වශයෙන් අඩු මට්ටමක ප්‍රගතියක් දක්වා තිබුණි . | කර ඇති අතර අනුමැතිය අපේක්ෂිතය. එබැවින් එහි ප්‍රගතිය 20% කි.<br>රජයේ ප්‍රතිපාදන නොමැති වීම, රටේ පැවති වාතාවරණය හා වියදම් සීමා චක්‍රලේඛවලට අනුගත වීම හේතුවෙන් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්හි අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගත නොහැකි වීම. | යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවක් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කළ යුතු වුවද අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු 2023 මාර්තු 31 වන විටත් පත්කර නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක පුරප්පාඩු පිරවීමට අදාල දැන්වීම ලබාගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සේවා කොමිෂම වෙත යොමුකර ඇත. | ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක්ද තෘතීයික මට්ටමේ පුරප්පාඩු 04 ක්ද ද්විතීය මට්ටමේ පුරප්පාඩු 07 ක්ද, ප්‍රාථමික මට්ටමේ 17 ක්ද වශයෙන් පුරප්පාඩු 36 ක් පැවතීම ඵලදායි සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා සෘණාත්මකව බලපා තිබුණි. | පවතින පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ කර ගනිමින් පවති. | ආයතනයේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපාන පුරප්පාඩු නොපමාව පිරවීමට සහ අවශ්‍ය වන්නේ නම් කාර්ය මණ්ඩල සංශෝධනයට පියවර ගත යුතුය. |
| (ආ) | ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැටුප් ලබන නිලධාරීන් 03 දෙනකු තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිසමට (RTI), නිලධාරීන් 04 ක් රඟුම් පාලක මණ්ඩලයට, නිලධාරීන් 02 ක් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි. උක්ත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිසමේ නිලධාරීන් තිදෙනාගෙන් අමාත්‍යාංශයට සේවයක් ලබා නොගෙන රු.1,559,255 ක් ගෙවා තිබුණි. | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා සංවර්ධන නිලධාරීන් 03 දෙනෙකු පත් කර ඇත.<br>ප්‍රසිද්ධ රඟුම්පාලක මණ්ඩලය සඳහා සංවර්ධන නිලධාරී 04 දෙනෙකු යොදවා ඇත. එම නිලධාරීන් 04 දෙනා සංස්කෘතික අමාත්‍යාංශයේ සිට මෙම අමාත්‍යාංශය වෙත ස්ථානමාරු කරන ලදුව මේ වනවිට එම අංශයට අනුයුක්ත කර ඇත. | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීමට අවධානය යොමු කළ යුතුය. |